Lakneel, W.A. Roshan
Department of Fine Arts, University of Kelaniya

*Paper: Equity*

# ශ්‍රී ලාංකාවේ පශ්චාත් යුද වාතාවරණය හා ප්‍රචාරණ මාධ්‍ය ක්‍රියාකාරිත්වය

වසර තිහකට ආසන්න කාලයක් තිස්සේ පැවැති ත්‍රස්තවාදී යුද්ධය නිම වී අද වන විට ශ්‍රී ලාංකේය පශ්චාත් යුද සමාජය එහි ප්‍රතිඵල භුක්ති විඳිමින් සිටී. වත්මන් ශ්‍රී ලාංකේය සමාජය තුළ ක්‍රියාත්මක සමස්ත මාධ්‍ය පද්ධතියේ බහුතරයක් වර්ධනය වූයේ එකී යුද පරිසරය තුළය. විවිධ මාධ්‍යවල ප්‍රචාරණ ආකෘතීන්, ශෛලීන්, සංඥාර්ථවේදී ප්‍රවණතා, මාධ්‍ය ආඛ්‍යාන ස්වරූප හා එම මාධ්‍යයන්හි පොදු දෘෂ්ටිවාදය හැඩගැසී පැවතියේ යුද ගැටුම්කාරී පරස්පරතා ඉස්මතු වන ආකාරයෙනි. එහෙත් යුද්ධයේ අවසානයත් සමග ත්‍රස්තවාදය විනාශ වී යාම, ශ්‍රී ලාංකේය සමාජයේ මතවාදී අර්බුදයකට තුඩු දී ඇති බව පෙනෙන අතර මාධ්‍ය ක්‍රියාකාරිත්වය අර්බුදයකට පත් වී ඇති බව පෙනේ.

මෙම පර්යේෂණයේ දී පශ්චාත් යුද කාලීන ලාංකේය සමාජය තුළ මාධ්‍ය ක්‍රියාකාරීත්වය, එහි අන්තර්ගතය, විවිධ මාධ්‍ය ක්‍රියාවලීන් පිළිබඳ ව සවිඥානික ව විග්‍රහ කිරීම, සංඥාර්ථවේදී ව ඇගයීම හා ප්‍රති අර්ථකථනයකට ලක්කිරීම සිදුකොට ඇත. එහි දී ලාංකේය විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සහ සෙසු ප්‍රචාරණ මාධ්‍යයන් ඇසුරෙන් සවිස්තරාත්මක ක්‍රමවේදය ඒ සඳහා උපයෝගී කොට ගැණින.

පෙර යුද සමාජය තුළ ක්‍රියාත්මක වූ ජනමාධ්‍ය, මේ වනවිට නිර්මාණාත්මක, වෘත්තීයමය ප්‍රතිපත්ති, ප්‍රතිමාන හා සමාජ ධුරාවලිය සම්බන්ධයෙන් වෙනස් ආකාරයකින් ක්‍රියාත්මක වෙයි. පශ්චාත් යුද වාතාවරණයක ලාංකේය සමාජය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන්නේ වාර්ගික සහජීවන සංස්කෘතියක් ගොඩනගා ගන්නේ කෙසේද යන්නයි. එවන් සහජීවනය පදනම් කරගත් සංස්කෘතියක් බිහි කිරීමට ප්‍රධාන වාහකයක් ලෙස ජනමාධ්‍ය දැක්වුව ද එම මාධ්‍ය එවන් සංස්කෘතියක් නිර්මාණය කිරීමට මෙතෙක් සමර්ථ වී නැත යන්න මෙම පර්යේෂණයෙන් සනාථ වේ.

**මුඛ්‍ය පදඃ පශ්චාත් යුද වාතාවරණය, ප්‍රචාරණ, සංඥාර්ථ**